# මීගමුව මහා නගර සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

මීගමුව මහා නගර සභාව මගින් පහත දැක්වෙන උපලේඛනයෙහි වූ බදුකර 2025.10.01 සිට 2026.12.31 දක්වා වසර 01 මාස 03 ක කාලයකට බදු දීම සඳහා මුද්‍රා තබන ලද පිටපත් දෙකකින් යුත් මිල ගණන් කැඳවනු ලැබේ.

**උපලේඛන 01**

| අනු අංකය | බදුකරය | ආපසු ගෙවන තැන්පත් මුදල රු. | ටෙන්ඩර් අයදුම්පත් ගාස්තුව රු. |
|---|---|---|---|
| 01 | මීගමුව මහා නගර සභා ප්‍රධාන කාර්යාලය ඇතුලු සභාවට අයත් වෙනත් ස්ථාන සඳහා ආරක්ෂාව | 50,000.00 | 3,000.00 |
| 02 | රාජපක්ෂ උද්‍යානය හා එම පරිශ්‍රය සඳහා ආරක්ෂාව | 50,000.00 | 3,000.00 |
| 03 | මීගමුව බස් නැවතුම්පල හා එම පරිශ්‍රය සඳහා ආරක්ෂාව | 50,000.00 | 3,000.00 |

**උපලේඛනය 02**

| අනු අංකය | බදුකරය | ආරක්ෂක නිලධාරීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| 01 | මීගමුව මහා නගර සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු සභාවට අයත් වෙනත් ස්ථාන සඳහා ආරක්ෂාව | ස්ථානභාර නිලධාරී (ප්‍රධාන) දිවා 2 රාත්‍රී 1<br>සාමාන්‍ය ආරක්ෂක නිලධාරී දිවා 6 රාත්‍රී 5<br>වෙනත් ස්ථාන සඳහා 47<br>(සාමාන්‍ය ආරක්ෂක නිලධාරී) |
| 02 | රාජපක්ෂ උද්‍යානය හා එම පරිශ්‍රය සඳහා ආරක්ෂාව | ස්ථානභාර නිලධාරී දිවා 1 රාත්‍රී 1<br>සාමාන්‍ය ආරක්ෂක දිවා 4 රාත්‍රී 3<br>(කාන්තා නිලධාරීන්ද අවශ්‍යයි) |
| 03 | මීගමුව බස් නැවතුම්පළ හා එම පරිශ්‍රය සඳහා ආරක්ෂාව | ස්ථානභාර නිලධාරී දිවා 1 රාත්‍රී 1<br>සාමාන්‍ය ආරක්ෂක දිවා 7 රාත්‍රී 6 |

ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කිරීම - 2025.07.16 දින සිට 2025.07.30 දක්වා මීගමුව මහා නගර සභා ප්‍රජා සංවර්ධන අංශයෙන්

ප්‍රසම්පාදන අයදුම්පත් භාර ගැනීම අවසන් කිරීම - 2025.07.31 පෙ.ව. 10.00ට එම වේලාවෙන් පසු ඉදිරිපත් කරනු ලබන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රසම්පාදන අයදුම්පත් විවෘත කිරීම - 2025.07.31 දින පෙ.ව. 10.30 ට

**කොන්දේසි**

1. අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ ආකෘති පත්‍ර ගාස්තුව + රජයේ අනුමත බදු මුදල් හා තැන්පත් මුදල ගෙවීමෙන් පසුව වේ.
2. අයදුම්පත සමග නිකුත් කරනු ලබන කොන්දේසිවලට එකඟව ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.
3. බදුකරය සඳහා ජයග්‍රාහී ලංසුකරු, සභාව විසින් ලිඛිතව දැනුම් දෙන දිනට හෝ ඊට පෙර අනුමත රක්ෂණ ආයතනයකින් ලබා ගත් රු. ලක්ෂ 10 වටිනා රක්ෂණාවරණයක් ඉදිරිපත් කර 2025.10.01 සිට 2026.12.31 දක්වා කාලයක් තුළ ආරක්ෂක සේවා සැපයීම සඳහා සහ නොකඩවා එය පවත්වාගෙන යාමට ආරක්ෂක ආයතනය එකඟ වන බවට ගිවිසුම්ගත විය යුතුය.
4. මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ ශ්‍රී ලංකා පුරවැසියන්ට පමණි.
5. ආරක්ෂක නිලධාරීන් දිවා රාත්‍රී දෙකෙහිම සේවයේ යෙදිය යුතුය.

   දෛනික වැටුප් (පැය 12) ස්ථානභාර නිලධාරී

   සාමාන්‍ය ආරක්ෂක නිලධාරී

   අයදුම්පතෙහි එම නිලධාරීන්ට ගෙවනු ලබන දෛනික වැටුප සටහන් කිරීම අනිවාර්යය වේ. යෙදිය යුතු නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන් යෙදවිය යුතු ස්ථාන උපලේඛනය 02 හි සඳහන් වේ.
6. ප්‍රසම්පාදන අයදුම්පත් මිල ගණන් අකුරෙන් හා ඉලක්කමෙන් නිවැරදිව පැහැදිලිව සඳහන් කළ යුතුය. පඩිපාලක ආඥා පනතට අදාළ අවම වැටුපට අඩුවෙන් මිල ගණන් ඉදිරිපත් කරනු ලබන හෝ නාගරික කොමසාරිස් විසින් පිළිගත නොහැකි යැයි තීරණය කරනු ලබන අවස්ථාවක එම ලංසු අවලංගු කරනු ලැබේ. ගණන් වෙනස් කරන්නේ නම් තනි ඉරකින් කපා අයදුම්පතෙහි අත්සන් කර සහතික කර තිබිය යුතුයි. වෙනස් කරන ලද මිල ගණන්ද නිවැරදිව පැහැදිලි අකුරෙන් හා ඉලක්කමෙන් ලියා තැබිය යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සභාවෙන් නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර මුල් පිටපත හා දෙවන පිටපත වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා එම පිටපත් දෙකම එක කවරයක බහා එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ මිල ගණන් ඉදිරිපත් කරන බදුකරයේ නම සඳහන් කර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව යන ලිපිනයට 2025.07.31දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. වැඩි විස්තර පරිපාලන නිලධාරී (ආයතන) 031-2222168 මගින් දැනගත හැකිය.
8. ප්‍රසම්පාදන අයදුම්පත් විවෘත කරන අවස්ථාවට ඔබ ආයතනයේ ලිඛිත අවසරය ඇති එක් අයෙකුට සහභාගි විය හැකිය.
9. තෝරාගත් සේවා ආයතන විසින් අදාළ නිලධාරීන්ට පඩි පාලක ආඥා පනතට අදාළ අවම වැටුප් හා සේවා අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට සාමාජික මුදල් ගෙවීමට බැඳී සිටින්නේය. තවද අදාළ ආයතනයට ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචිය ලබා තිබීම අනිවාර්ය වේ.
10. ඉහත කී සේවාවන් සැපයීමේදී ආරක්ෂක නිලධාරීන්ට අවශ්‍ය වන සියළුම ද්‍රව්‍ය හා උපකරණ සේවා ආයතනය විසින් සපයා ගත යුතුය.
11. ආරක්ෂක සේවයේ යොදවනු ලබන ස්ථාන භාර නිලධාරි විශ්‍රාමලත් හෝ විධිමත් පරිදි සේවයෙන් ඉවත් වූ ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ යෙදුනු , වයස අවු 55 ට අඩු නිලධාරියෙකු විය යුතුය. ආරක්ෂක සේවයේ යොදවනු ලබන අනෙකුත් සියලුම නිලධාරීන් එම සේවයේ පළපුරුද්ද ඇති අවු.50 ට අඩු අය විය යුතු අතර, ඔවුන් මනා සෞඛ්‍ය සම්පන්න අය විය යුතුය.
12. ටෙන්ඩර්කරුවන් අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් සනාථ කළ යුතු වේ. ඔබ ආයතනය විසින් ඉදිරිපත් කරන මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මීගමුව නගර සභාව සතු වේ.
13. කිසිදු සාධාරණ හේතුවකින් තොරව ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පතුව සභා සතු කර අසාධු ලේඛනගත කරනු ලැබේ.

**නාගරික කොමසාරිස්**
**මහා නගර සභාව, මීගමුව.**